# ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිල්පීය අංශයේ නාවිකයින් සඳහා පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිල්පීය අංශයේ ආධුනික නාවික ශිල්පීන් හා ශිල්පිනියන් සඳහා පුරප්පාඩු පවතින අතර, පහත සඳහන් සුදුසුකම් ඇති පිරිමි හා කාන්තා අයදුම්කරුවන්ගෙන්/ අයදුම්කාරිනියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යයෙන් ම සපුරාලිය යුතුය.

| | | |
|---|---|---|
| අ. | පුරවැසිභාවය යුතුයි. | - ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය |
| ආ. | වයස | - 2025 ඔක්තෝබර් මස 10 වන දිනට අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 24 ට නොවැඩි විය යුතුය. |
| ඇ. | උස | - පිරිමි 5' 5"(සෙ.මී 165.10) කාන්තා 5' 2" (සෙ.මී 157.48). |
| ඈ. | ශරීර ස්කන්ධ දර්ශකය | - 17-27. |
| ඉ. | පපුව | - (පිරිමි) 32"(සෙ.මී 81.28). |
| ඊ. | වර්ණ දර්ශනය | - එස්ටීඩී II |
| උ. | දුර දර්ශනය | - 6/6 (උපැස්/ අක්ෂි කාච රහිතව) (6/12 දෘෂ්ටි තීක්ෂණත්වය උපැස් මගින් 6/6 දක්වා නිවැරදි කර ඇති අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් සලකා බැලිය හැක). |
| ඌ. | සිවිල් තත්ත්වය | - අයදුම්කරුවන් අවිවාහක විය යුතුයි. කිසිම ආධුනිකයෙකුට පුහුණුව ලබන කාලයේ දී විවාහ ගිවිස ගැනීමට අවසර දෙනු නොලැබේ. |

2. **බඳවා ගනු ලබන අංශයන් :**

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය මගින් හෝ ශ්‍රී ලංකා නාවික තාක්ෂණ ආයතනය මගින් පිරිනමනු ලබන තුන් අවුරුදු පූර්ණ කාලීන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව සඳහා පහත සඳහන් අංශයන් වෙත බඳවා ගනු ලැබේ.

(1) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (නාවික ඉංජිනේරු)
(2) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (මෝටර් රථ ඉංජිනේරු)
(3) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (විදුලි ඉංජිනේරු)
(4) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු)
(5) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (නැව්බඳ අලුත්වැඩියාවන් සහ නැව් තැනීම සම්බන්ධ ඉංජිනේරු)

3. **අධ්‍යාපන සුදුසුකම් :**

අ. අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව මව්බස, ඉංග්‍රීසි භාෂාව සහ විද්‍යාව ඇතුළුව විෂයයන් 06 ක් සමත් වී තිබිය යුතුය.

ආ. අ.පො.ස. (උ/පෙළ) විභාගය සඳහා,

(1) භෞතික විද්‍යා විෂය ධාරාව යටතේ පෙනී සිටීම
හෝ
(2) ජීව විද්‍යා විෂය ධාරාව යටතේ පෙනී සිටීම
හෝ
(3) තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ,තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහ ඉංජිනේරු තාක්ෂණවේදය යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම

4. ඉහත 1 සහ 3 ඡේදයන් හි දක්වා ඇති අවශ්‍යතා සපුරාලනු නොලබන අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරිනියන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්ෂාව කරනු ලැබේ. *ගැසට්* පත්‍රයේ ඉල්ලා ඇති මිම්වලට අනුව උස, ඇස් පෙනීම හා බර නොමැති අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කරුවෙකුගේ/අයදුම්කාරිනියකගේ උස නියමිත පරිදි නොමැති වුවද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවක් ඇත්නම් නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි එකී අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් පිළිබඳ සලකා බලනු ලැබේ.

5. **සේවා කොන්දේසි :**

අ. අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් ආධුනිකයන් වශයෙන් බඳවා ගනු ලබන අතර,ඔවුන් මූලික පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතු වේ.

ආ. පුහුණුව ලබන කාලසීමාව තුළ දී හා ඉන් පසුව, ආධුනිකයන් නාවික හමුදා නීතියට යටත් විය යුතුයි.

ඇ. සෑම ආධුනිකයෙකුට සියලුම ආයිත්තම් සහිත නිල ඇඳුම් සපයනු ලැබේ.

ඈ. පුහුණුව ලබන කාලසීමාව තුළ, ආධුනිකයින් හට නවාතැන් පහසුකම් හා ආහාර නාවික හමුදාව මගින් සපයනු ලැබේ.

ඉ. පුහුණුවන කාලසීමාව තුළ දී, යම් ආධුනිකයෙකු හට සිය කැමැත්තෙන් නාවික හමුදාවෙන් ඉවත් වීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම ආධුනිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම ආධුනිකයා විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.